ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,458 - 2025 ඔක්තෝබර් මස 10 වැනි සිකුරාදා - 2025.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

	පිටුව
තනතුරු අ◌ැබෑර්තු	2304
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	2319

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ඔක්තෝබර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

එස්. ඩී. පාඩිකෝරාළ,
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2301- B 82727 — (2025/10)
F 1 -

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ භාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

තනතුරු ඇබෑර්තු

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

සමාජ සේවා දෙපාර්තමේන්තුව

සංඥා භාෂා පරිවර්තක/ පෙර පාසල් ගුරු/ අරක්කැමි සහායක/ උපස්ථායක (III ශ්‍රේණිය)

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ

සංඥා භාෂා පරිවර්තක තනතුරු 16ක්,
පෙර පාසල් ගුරු තනතුරු 07ක්,
අරක්කැමි සහායක තනතුරු 04ක් හා
උපස්ථායක තනතුරු 05ක්

සඳහා බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට 2025.11.10 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සංඥා භාෂා පරිවර්තක/පෙර පාසල් ගුරු/ අරක්කැමි සහායක/ උපස්ථායක - (III ශ්‍රේණිය) සඳහා බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කර තිබිය යුතුය. www.socialservices.gov.lk වෙබ් අඩවිය හරහා ද ආදර්ශ අයදුම්පත හා විස්තර ලබා ගත හැක.

මෙම තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම්:-

1. සංඥා භාෂා පරිවර්තක - තනතුරු 16

ප්‍රධාන කාර්යාලය -බිහිරි පරිවර්තක 01/දමිළ පරිවර්තක - 01
තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය - 01
අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය - 01
සීදූව වෘත්තීය පුහුණු ආයතනය - 01
කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනය - 01
මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය - 01
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
පොළොන්නරු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01

1.1 විවෘත බඳවා ගැනීම :

1.1.1 වයස් සීමාව :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුයි.

1.1.2 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වී තිබීම;

සහ

(ආ) අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සියලුම විෂයන්ගෙන් එකවර සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම(පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

1.1.3. වෘත්තීය සුදුසුකම් :-

ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය

හෝ

ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය

හෝ

තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වනු ලබන වසරකට නොඅඩු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය

1.1.4 පළපුරුද්ද :- අදාළ නොවේ.

1.1.5 කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.1.6. වෙනත් :-

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම,
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම,
iii. තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.1.7. බඳවාගැනීමේ ක්‍රමය :- ලිඛිත හා වෘත්තිය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

1.1.7.1 ලිඛිත පරීක්ෂණය :-

විෂයයන්	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
බුද්ධි පරීක්ෂණය	කාලය පැය 01	100	40
භාෂා හැකියාව	කාලය පැය 01	100	40

1.1.7.2 වෘත්තිය පරීක්ෂණය :- සංඥා භාෂා ප්‍රායෝගික දැනුම පරික්ෂා කිරීම

විෂයයන්	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
සංඥා භාෂා ප්‍රායෝගික දැනුම පරික්ෂා කිරීම	කාලය පැය 01	100	40

1.1.8 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

තනතුරට නියමිත සුදුසුකම් සපුරා තිබේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා සහතිකපත් පරීක්ෂාව (ලකුණු ලබාදෙනු නොලැබේ.)

1.1.9. වැටුප් පරිමාණය :- රා.ප.ච. 10/2025 අනුව MN 02 -2025

වැටුප් පරිමාණය රු.48,470-10x540-11x630-10x1,010-10x1,190-රු. 82,800/- වේ.

(මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

1.1.10 සටහන-

ලිඛිත සහ වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, එම අවස්ථාවේදීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් අතුරින් ලිඛිත හා වෘත්තීය පරීක්ෂණ දෙකෙහි මුලු ලකුණු එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

1.1.11. සේවා කොන්දේසි :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 18/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව වසර තුනක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

1.2 සීමිත බඳවා ගැනීම :-

1.2.1 අධ්‍යාපන සුදුසුකම් - සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුලුව අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සමත්වී තිබීම.

1.2.2 වෘත්තීය සුදුසුකම් -

ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය;

හෝ

සමාජ සංවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය;

හෝ

තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වනු ලබන වසරකට නොඅඩු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය.

1.2.3 පළපුරුද්ද -

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ උපස්ථායක හෝ නිවාස පාලක තනතුරක වසර 05කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

1.2.4 කායික සුදුසුකම්-

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.2.5 වෙනත්-

i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර පහක (05) කාලසීමාව තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

1.2.6 වයස - අදාළ නොවේ

1.2.7 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත සහ වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

1.2.7.1. ලිඛිත විභාගය

විෂයයන්	කාලය	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
බුද්ධි පරීක්ෂණය	කාලය පැය 01	100	40
භාෂා හැකියාව	කාලය පැය 01	100	40

1.2.7.2. වෘත්තීය පරික්ෂණය-

විෂයන්	කාලය	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
සංඥා භාෂා ප්‍රායෝගික දැනුම පරික්ෂා කිරීම	කාලය පැය 01	100	40

1.2.8 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය-

තනතුරට නියමිත සුදුසුකම් තිබේද යන්න පරික්ෂා කිරීම සඳහා සහතිකපත් පරික්ෂාව (ලකුණු ලබා දෙනු නොලැබේ).

1.2.9. සටහන

ලිඛිත සහ වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, එම අවස්ථාවේ දීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් අතුරින් ලිඛිත හා වෘත්තීය පරීක්ෂණ දෙකෙහි මුලු ලකුණු එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

1.2.10. සේවා කොන්දේසි

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 18/2020 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර තුනක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

2. පෙර පාසල් ගුරු (තනතුරු 07)

සිතිජය ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය - 03

කොට්ටාව ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය - 03

නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය - 01

2.1 වයස් සීමාව :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුයි.

2.2 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව. ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වී තිබීම.

(ආ) අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබිම.

2.3. වෘත්තීය සුදුසුකම් :-

රජයේ ලියාපදිංචි ආයතනයකින් පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ මාස 03 කට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

2.4 පළපුරුද්ද :- අදාළ නොවේ.

2.5 බඳවාගැනීමේ ක්‍රමය :-

ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍ර දෙකෙන්ම සමත්, උපරිම ලකුණු සංඛ්‍යාවක් ලබාගන්නා සුදුසුකම්ලත් අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනේ.

2.5.1 ලිඛිත පරීක්ෂණය :-

විෂයයන්	කාලය	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
බුද්ධි පරීක්ෂණය	කාලය පැය 01	100	40
භාෂා හැකියාව	කාලය පැය 01	100	40

2.6. වැටුප් පරිමාණය :- රා.ප.ච. 10/2025 අනුව MN 01 -2025

වැටුප් පරිමාණය

රු.45,230/- 10X540-11X630-10X890-10X1,190-රු.78,360/- වේ.

(මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

2.7. සේවා කොන්දේසි :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 18/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව වසර තුනක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

2.8 සටහන :-
ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර තෝරා ගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක් අනිවාර්යෙන් ම සේවය කළ යුතුය.

3. අරක්කැමි සහායක (තනතුරු 04) / උපස්ථායක (තනතුරු 05)
අරක්කැමි සහායක - 04
වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය - 01
බටුගම්මන වෘත්තීය පුහුණු ආයතනය - 01
කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනය - 01
මඩකලපුව වෘත්තීය පුහුණු ආයතනය -01

උපස්ථායක - 05

රිදියගම කලන නිවර්තන නිවාසය (උපස්ථායක) -02
සීදූව වෘත්තීය පුහුණු ආයතනය (උපස්ථායිකා) -01
මඩකලපුව වෘත්තීය පුහුණු ආයතනය (උපස්ථායිකා) - 01
කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනය (උපස්ථායිකා) -01

3.1 වයස් සීමාව :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි.

3.2 අධ්‍යාපන සුදුසුකම් :-
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

3.3. වෘත්තීය සුදුසුකම් :-

අරක්කැමි සහායක

රජයේ ලියාපදිංචි ආයතනයක සූප ශාස්ත්‍රය පිළිබඳ මාස 03 කට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

උපස්ථායක

රජයේ රෝහලක, බෙහෙත් ශාලාවක හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි පෞද්ගලික රෝහලක උපස්ථාන කටයුතු සම්බන්ධ පුහුණුවක් ලබා තිබීම. (සහතික මඟින් සනාථ කළ යුතුය).

3.4. පළපුරුද්ද :-
තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

3.5. බඳවා ගැනීමේ ක්‍රමය :-
මූලික සුදුසුකම් සපුරන අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවාගැනීම සිදු කෙරේ.

3.6. වැටුප් පරිමාණය :- රා.ප.ච. 10/2025 අනුව PL 1 -2025
වැටුප් පරිමාණය
රු.40,000-10x450-10x490-10x540-12x590-රු. 61,880/- වේ.

(මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

3.7. සේවා කොන්දේසි :-
මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

3.8 සටහන
ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර තෝරා ගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය.

දර්ශනී කරුණාරත්න,
සමාජ සේවා අධ්‍යක්ෂ.

සමාජ සේවා දෙපාර්තමේන්තුව,
2 මහළ,
II අදියර,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින.

.... තනතුර සඳහා බඳවාගැනීමේ අයදුම් පත්‍රය

භාෂා මාධ්‍ය : [ ]

01. මුලකුරු සමඟ නම : - ....
02. මුලකුරු වලින් හැඳින්වෙන නම් : - ....

....

03. ලිපිනය : - ....
04. දුරකතන අංකය : - ....
05. ජාතික හැඳුනුම්පත් අංකය : - ....
06. උපන් දිනය : - ....
07. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : - අවුරුදු:-............ මාස:-........... දින:-................
08. විවාහක/ අවිවාහක බව : - ....
09. ස්ත්‍රී / පුරුෂ භාවය : - ....

10. අධ්‍යාපන සුදුසුකම් : -

I. **අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය**

වර්ෂය : - .... විභාග අංකය : - ....

විෂයයන්	*ශ්‍රේණිය*	*විෂයයන්*	*ශ්‍රේණිය*
ගණිතය			
සිංහල/දෙමළ/ඉංග්‍රීසි			

II **අ.පො.ස. (උසස් පෙළ) විභාගය :**

වර්ෂය : - .... විභාග අංකය : - ....

විෂයයන්	*ශ්‍රේණිය*	*විෂයයන්*	*ශ්‍රේණිය*

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :-

පාඨමාලාවේ නම	*ආයතනය*	*පාඨමාලා කාලය*

12. පළපුරුද්ද:-

....
....
....

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

....,
අයදුම්කරුගේ අත්සන.

10-147

සංශෝධනයයි

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් හා අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය දීර්ඝ කිරීම

අංක 2445 හා 2025.07.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* නිවේදනය කර තිබූ මාතර දිස්ත්‍රික්කයට අදාළ මුස්ලිම් හා අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් ධූරයන්හි පහත සඳහන් පුරප්පාඩු තනතුරුවලට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2025.10.30** දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

දිස්ත්‍රික්කය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*	*ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර*	*ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය*
මාතර	වැලිපිටිය	වැලිගම් කෝරළය කොට්ඨාසයේ වටගෙදරමුල්ල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය	දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර
මාතර	වැලිගම	ගල්බොක්ක කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය	දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර
මාතර	අකුරැස්ස	වැලිගම් කෝරළය කොට්ඨාසයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය	දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය හැර අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

10-164

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

මාධ්‍ය නිලධාරි (දෙමළ)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද සමඟ **2025 ඔක්තෝබර් මස 31 වැනි** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. තමන් අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකිය)

මාධ්‍ය නිලධාරි (දෙමළ) තනතුර - (මුළු පුරප්පාඩු සංඛ්‍යාව - 01)

1. ***රැකියා විස්තරය.-*** මාධ්‍ය අංශයට පැවරී ඇති රාජකාරී ඉටු කිරීම සඳහා කළමනාකාරීත්වයට සහාය වීම,

2. ***වැටුප් පරිමාණය -*** 2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

රු. 58,660-9x1190/3x1360 – රු. 73,450 වේ.

(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.100,000/- පමණ වේ).

3. **වයස් සීමාව .-** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

4. **අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද .-**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විශ්ව විද්‍යාලයක් වෙතින් ලබා ගත් දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය (බහු මාධ්‍ය කලා) / (දෘශ්‍ය සන්නිවේදන සැලසුම් කලා);

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විශ්ව විද්‍යාලයක් වෙතින් ලබා ගත් ශාස්ත්‍රවේදී උපාධිය (සන්නිවේදනය/ ජනසන්නිවේදනය/ ජනමාධ්‍ය/ මහජන සම්බන්ධතා හා මාධ්‍ය කළමනාකරණය/ සන්නිවේදනය හා නිර්මාණාත්මක කලා/ සමාජ විද්‍යාව/ දේශපාලන විද්‍යාව විෂයයක් වශයෙන්);

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විශ්ව විද්‍යාලයක් වෙතින් ලබා ගත් ජනමාධ්‍යවේදය උපාධිය;

සමඟ

ජනමාධ්‍යවේදය හෝ ජනසන්නිවේදනය යන ක්ෂේත්‍රවල වසර තුනකට නොඅඩු පළපුරුද්ද.

5. ***බඳවා ගැනීමේ ක්‍රමය -*** ලිඛිත පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

සම්මුඛ පරීක්ෂණයේ දී, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ.

අනු අංකය	*විෂයය ක්ෂේත්‍රය*
1	අමතර අධ්‍යාපන සුදුසුකම්
2	භාෂාව සහ සන්නිවේදන කුසලතා
3	පරිගනක සාක්ෂරතාව
4	සේවා පළපුරුද්ද සහ ක්ෂේත්‍ර දැනුම
5	පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා

6. **සේවා නියමයන් හා කොන්දේසි:-**

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයට අදාළවන මුල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත්වෙනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

7. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

8. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

9. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

10. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ සාවද්‍ය යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතුවනු ඇත.

11. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ, ඉහත සඳහන් කළ අධ්‍යාපන සහතිකවල සහ සේවා සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ, දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන (දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා යොමු කරනු ලැබුව ද, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන සහ ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

චමින්ද කුලරත්න,
වැ.බ. පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2025 ඔක්තෝබර් මස 08 වැනි දින.
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ආදර්ශ අයදුම්පත්‍රය

මාධ්‍ය නිලධාරි (දෙමළ)

01. (අ) මුලකුරු සමග නම (**සිංහලෙන්**) :-
………………………………………………………………………………
………………………………………………………………………………

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම (**සිංහලෙන්**): -
………………………………………………………………………………
………………………………………………………………………………

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):- (Mr./Mrs. /Miss.)
………………………………………………………………………………
………………………………………………………………………………
………………………………………………………………………………

02. ජාතික හැඳුනුම්පත් අංකය :

03. (අ) පෞද්ගලික ලිපිනය:-
………………………………………………………………………………
………………………………………………………………………………

දුරකතන අංකය :-

(ආ) කාර්යාලයීය ලිපිනය:-
………………………………………………………………………………
………………………………………………………………………………

දුරකතන අංකය:-

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :

පෞද්ගලික : ☐ කාර්යාලයීය : ☐

04. (අ) උපන් දිනය :-..
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය.)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :- අවුරුදු .... මාස .... .දින ....

05. විවාහක/අවිවාහක බව : - (විවාහක / අවිවාහක)

06. ස්ත්‍රී / පුරුෂ භාවය :- (ස්ත්‍රී/ පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව:- (ඔව් / නැත)

08. උසස් අධ්‍යාපන සුදුසුකම් :-

(උපාධි සහතිකයේ සහ උපාධියට අදාළ විෂයයන් දක්වන සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය)
(අදාළ කොටුව තුළ (√) සලකුණ යොදන්න)

උපාධිය		විශ්ව විද්‍යාලය	වර්ෂය
(අ) දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය (බහු මාධ්‍ය කලා)	☐	....	....
(ආ) දෘශ්‍ය කලා (විශේෂ) උපාධිය (දෘශ්‍ය සන්නිවේදන සැලසුම් කලා)	☐	....	....
(ඇ) ශාස්ත්‍රවේදී උපාධිය පහත එක් විෂයයක් හෝ ඇතුළත්ව	☐		
• සන්නිවේදනය	☐	....	....
• ජනසන්නිවේදනය	☐	....	....
• ජනමාධ්‍ය	☐	....	....
• මහජන සම්බන්ධතා හා මාධ්‍ය කළමනාකරණය	☐	....	....
• සන්නිවේදනය හා නිර්මාණාත්මක කලා	☐	....	....
• සමාජ විද්‍යාව	☐	....	....
• දේශපාලන විද්‍යාව	☐	....	....
(ඈ) ජනමාධ්‍යවේදය උපාධිය	☐	....	....

වෙනත් අධ්‍යාපන සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)
....
....

09. වෘත්තීයමය පළපුරුද්ද :- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

ආයතනය	*තනතුර*	*සේවා කාලය*

10. වත්මන් රකියාව පිළිබඳ විස්තර :

(අ) ආයතනයේ නම හා ලිපිනය :-..
(ආ) මුල් පත්වීමේ දිනය :-...
(ඇ) දැනට දරන තනතුර :-...
(ඈ) මාසික මූලික වැටුප :-..
(ඉ) දීමනා :-..
(ඊ) දළ වැටුප :-..

11. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :-...

12. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? (ඔව්/නැත)
එසේ නම් එම විස්තර සඳහන් කරන්න.
....

ම විසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතුවන බව දනිමි.

දිනය :.............................. ....
අයදුම්කරුගේ අත්සන

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

(රාජ්‍ය ආයතනවල / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ .... තනතුර දරන, ... මයා / මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති / නොමැති බවත්, ඔහුගේ / ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක / නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

දිනය : ....
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

10-182

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 වැඩපරීක්ෂක තනතුර සඳහා බඳවා ගැනීම - (විවෘත) 2025

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ වැඩ පරීක්ෂක III ශ්‍රේණියේ තනතුරෙහි පවතින පුරප්පාඩු 13ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්වරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් ලබාදෙන ලකුණු මත තෝරා ගනු ලබයි. පත්වීම ක්‍රියාත්මකවන දිනය ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබේ.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, 2012.02.16 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 නිලධර ගණයේ වැඩ පරීක්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ නියමයන්ට හා කොන්දේසිවලට ද එම පටිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන්නා වූ සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු තනතුරෙහි III ශ්‍රේණිය සඳහා පත් කෙරෙනු ඇත.

2.2 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. එහෙත් නව පත්වීම්ලාභීන් හට පිරිනමනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම්ලාභීන් යටත් විය යුතු වේ. වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

2.3 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරින් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

2.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

2.6 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

2.7 සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර, තෝරාගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාලයේ වසර පහක (05) අනිවාර්ය සේවයෙන් පසුව පමණක් වැඩ පරීක්ෂක ස්ථානමාරු පටිපාටියට අනුව වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

03. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය,

රු. 45,230-10 x 540-11 x 630-10 x890-10 x 1190- රු. 78,360/- (MN 1-2025) වේ.

එමෙන්ම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන III හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමිවේ.

04. බඳවා ගැනීමේ සුදුසුකම්

4.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) i. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව,
ii. ගණිතය සහ
iii. තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින්(06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

4.2 පළපුරුද්ද :
රජය විසින් පිළිගත් ආයතනයක සමාජ සේවා හා සමාජ වැඩ පිළිබඳව වසරක පළපුරුද්ද.

4.3 වයස් සීමාව :
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතුය.

4.4 කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

4.5 අනෙක් සුදුසුකම් :

- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :
ප්‍රජා පාදක විශෝධන කොමසාරිස් වරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද ලකුණුවල කුසලතාව මත පත් කිරීම කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමේ ක්‍රමය: ලකුණු 100

	විෂයය	ලකුණු	උපරිම ලකුණු
01.	අතිරේක අධ්‍යාපන සුදුසුකම් : රජයේ පිළිගත් ආයතනයකින්		20
	i. විශේෂවේදී උපාධිය	20	
	ii. උපාධිය	15	
	iii. ඩිප්ලෝමා පාඨමාලා (මාස 06 හෝ ඊට වැඩි)	10	
	iv. සහතික පත්‍ර පාඨමාලා (මාස 03 හෝ ඊට වැඩි)	05	
	v. මූලික සුදුසුකමට අමතරව සහ අ.පො.ස.(උ/පෙළ)ප්‍රතිඵල අනුව		
	විශිෂ්ට සාමාර්ථ (A) (එක් විෂයකට ලකුණු 03 බැගින්)	06	
	අධි සම්මාන සාමාර්ථ (B) (එක් විෂයකට ලකුණු 02 බැගින්)	04	
	සම්මාන සාමාර්ථ (C) (එක් විෂයකට ලකුණු 01 බැගින්)	02	
	සාමාන්‍ය සාමාර්ථ (S) (එක් විෂයකට ලකුණු 0.5 බැගින්)	01	
	(i සිට iv දක්වා ලබා ගත් ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ)		
02.	ඉංග්‍රීසි භාෂා දැනුම :		20
	i. වසරක් හෝ ඊට වැඩි උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම හෝ මූලික උපාධිය ඉංග්‍රීසි භාෂාවෙන් හදාරා තිබීම	20	
	ii. වසරක හෝ ඊට වැඩි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම	18	
	iii. අ.පො.ස.(උ/පෙළ) විභාගයේ ප්‍රධාන විෂයයක් ලෙස සමත් වී තිබීම	15	
	iv. සහතික පත්‍ර පාඨමාලා (මාස 06 හෝ ඊට වැඩි)	12	
	v. අ.පො.ස.(උ/පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා සම්මානයක් හෝ ඊට වැඩි සාමාර්ථයක් සඳහා	10	
	vi. අ.පො.ස.(උ/පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සමත් වීම	05	
	vii. මූලික සුදුසුකමට අමතරව අ.පො.ස.(සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂය සඳහා		
	විශිෂ්ට සාමාර්ථ (A)	08	
	අධි සම්මාන සාමාර්ථ (B)	06	
	සම්මාන සාමාර්ථ (C)	04	
	සාමාන්‍ය සාමාර්ථ (S)	02	
	(ලබාගත් ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ)		

	විෂයය	ලකුණු	උපරිම ලකුණු
03	පරිගණක දැනුම : රජය පිළිගත් ආයතනයක් මගින් i. උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් (වසරක් හෝ ඊට වැඩි) ii. ඩිප්ලෝමා පාඨමාලාවක් (වසරක් හෝ ඊට වැඩි) iii. සහතිකපත්‍ර පාඨමාලාවක් (මාස 06 හෝ ඊට වැඩි) iv. වෙනත් පාඨමාලා (මාස 03- 06 අතර) (ලබා ගත් ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ)	 25 20 10 05	25
04.	අතිරේක පළපුරුද්ද : සමාජ සේවා හා සමාජ වැඩ සම්බන්ධයෙන් ක්‍රියාකාරී දායකත්වය (වසරක පළපුරුද්දට අමතරව වසරකට ලකුණු 06 බැගින් වසර 05 ක් දක්වා)	30	30
05.	සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අනුමැතිය පරිදි නායකත්වය, පෞරුෂය හා සන්නිවේදන කුසලතා	05	05
06	එකතුව		100

06. අයදුම් කිරීමේ ක්‍රමය

අයදුම්පත්‍රය මේ සමඟ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතු අතර, සෙ.මී. 22 -29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු වේ. අදාල තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන මූලික සුදුසුකම් නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත්‍රය ලැබුණු බව දන්වනු නොලැබේ.

07. අයදුම්පත් යොමු කිරීම :

7.1 මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් **2025.10.24** දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. :

ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
15 මහළ
මෙහෙවර පියෙස
නාරාහේන්පිට
කොළඹ 05

7.2 අයදුම්පත් කැඳවන අවසාන දිනය **2025.10.24** වේ. එම දිනට අදාළ සුදුසුකම් සියල්ල සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3 දැනට රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු/සංස්ථා/ මණ්ඩල/සිවිල් ආයතන) නියුතු නිලධාරින්ගේ අයදුම්පත් අපේක්ෂකයා තෝරා ගතහොත් එම ආයතනයෙන් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

7.4 අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ “ වැඩපරීක්ෂක තනතුර සඳහාවන බඳවා ගැනීම - (විවෘත) - 2025 ” යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

සැළකිය යුතුය :

I අයදුම්පත්‍රයේ සඳහන් අංක 02 සිට අංක 04 දක්වා වූ සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සහතිකපත්වල ඡායාස්ථ පිටපත් අයදුම්පත්‍රය සමග, අයදුම්කරු විසින් සහතික කර එවිය යුතුය. ඒ අනුව සුදුසුකම් පරීක්ෂා කර ඉහළම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 1:10 අනුපාතයට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

II සහතික පත්වල මුල් පිටපත් ඉල්ලූ අවස්ථාවල දී ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

III රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරින් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය.

IV රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ හා ඊට සිදු කර ඇති සංශෝධනයන් හී කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

(මෙම *ගැසට්* නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.)

දිලාන් ගුණරත්න,
ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්

2025 සැප්තැම්බර් මස 30 වැනි දින.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ වැඩ පරීක්ෂක III ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම (විවෘත) - 2025

01. පුද්ගලික තොරතුරු :

1. සම්පූර්ණ නම(සිංහල/දෙමළ) :...
   සම්පූර්ණ නම(ඉංග්‍රීසියෙන්) :...
2. මුලකුරු සමඟ නම(සිංහල/දෙමළ) :...
   මුලකුරු සමඟ නම(ඉංග්‍රීසියෙන්) :...
3. ස්ථිර ලිපිනය(සිංහල/දෙමළ) :...
   ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි) :...
4. ස්ත්‍රී/පුරුෂ භාවය :...
5. විවාහක/අවිවාහක බව :..
6. ජාතික හැඳුනුම්පත් අංකය :..
7. උපන් දිනය: වර්ෂය :.................. මාසය :................ දිනය :...............
8. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස : අවු. : .... මාස. : .... දින :........
9. දුරකථන අංකය : ....

02. අධ්‍යාපන සුදුසුකම් :

2.1. අ.පො.ස (සා.පෙළ) විභාග ප්‍රතිඵල:

(1). විභාග වර්ෂය:.................................

(2). විභාග අංකය:.................................

(3). විභාග ප්‍රතිඵල:

විෂය	*ශ්‍රේණිය*	*විෂය*	*ශ්‍රේණිය*
1.		6.	
2.		7.	
3.		8.	
4.		9.	
5.		10.	

2.2. අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල:

(1). විභාග වර්ෂය:.................................

(2). විභාග අංකය:.................................

(3). විභාග ප්‍රතිඵල:

විෂය	*ශ්‍රේණිය*	*විෂය*	*ශ්‍රේණිය*
1.		3.	
2.		4.	

03.

3.1 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

අනු අංකය	*සුදුසුකම*	*ලබා ගත් ආයතනය*

3.2 ඉංග්‍රීසි භාෂාව හා දැනුම :

අනු අංකය	*සුදුසුකම*	*ලබා ගත් ආයතනය*

3.3 පරිගණක දැනුම

අනු අංකය	*සුදුසුකම*	*ලබා ගත් ආයතනය*

3.4 සමාජ සේවා /සමාජ වැඩ පිළිබඳ පළපුරුද්ද

අනු අංකය	*සුදුසුකම*	*ලබා ගත් ආයතනය*

04. අයදුම්කරුගේ සහතිකය

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙහි සඳහන් කරුණු සාවද්‍ය බව අනාවරණය වුවහොත්, ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

දිනය:................................ ....

ඉල්ලුම්කරුගේ අත්සන

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ....මහතා/ මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බව ද /ඔහු /ඇය මා ඉදිරිපිට දී .... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

....

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය:.....................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :............................

තනතුර :..

ලිපිනය :...
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

ආයතන ප්‍රධානියාගේ සහතිකය

.... මහතා / මහත්මිය/මෙනවිය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ ස්ථිර සේවකයෙකු/ සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුරට අදාළව ගැසට් පත්‍රයේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිදු විනය ක්‍රියා මාර්ගයක් පවතින/ නොපවතින බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

....,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ බලය
පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය :.....................
තනතුර :..
අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව...
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10-88

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනඥ නිලධාරීන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2025)

First Efficiency Bar Examination for Statisticians of the Department of Census and Statistics – 2016 (2025)

සංඛ්‍යාලේඛනඥ තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පටිපාටිවල විධිවිධානවලට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් **2026 ජනවාරි මාසයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ඔක්තෝබර් මස 13 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2025 නොවැම්බර් මස 07 වැනි දින රාත්‍රී 09.00ට අවසන් වේ.** අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- **සටහන**

  අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයන් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

03. *විභාග ගාස්තු* : විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ ඉන් කොටසකට හෝ පළමුවරට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන් පසු අයදුම් කරන ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 300/- ක විභාග ගාස්තුවක් අය කෙරේ. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of Bank of Ceylon).

• සටහන :-

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

04. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පතේ මුද්‍රිත පිටපත දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

05. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීමට අදාළ නම්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති

අයදුම්කරුවන් වෙත, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම ප්‍රතිඵලදායී වනු ඇත.

07. විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු අතර, එය ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය. එමෙන්ම, විභාගය සඳහා පෙනී සිටි පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

08. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ගෙන් පළමුවර විභාගයට පෙනී සිටින නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ. තමාට නියමිත විභාග ශාලාවේ දී ම විභාගයට පෙනී සිටිය යුතු අතර, තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

09. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය ලෙස, රාජ්‍ය සේවයට ඇතුළත්වීම සඳහා පැවැති අදාළ තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට ඇතුළත් වූ අයදුම්කරුවකු නම්, රාජ්‍ය සේවයට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද තෝරා ගත යුතුය. විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

11. විභාග පටිපාටිය :
ඉහත තනතුරට අදාළ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

විෂයය	*කාලය*	*ලකුණු*	*සමත් ලකුණු*
1. පරිපාලනය	පැය 02 යි	100	40%
2. රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය	පැය 02 යි	100	40%
3. ඉංග්‍රීසි	පැය 02 යි	100	40%
4. ව්‍යවහාරික සංඛ්‍යානය	පැය 03 යි	100	40%

(01) පරිපාලනය (විෂයය අංක 01)

I කොටස - පරිපාලනය
II කොටස - කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

VI, VII, IX, XI, XII, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII.

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :-
  a) එක් කොටසකට ප්‍රශ්න හතර බැගින් ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. ප්‍රශ්න ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා ස්වරූපය වේ.
  b) I හා II කොටස්වලින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.
  c) සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

(02) රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (විෂයය අංක 02)

මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද මත සැකසේ.

I - සියලුම වගන්ති
II - සියලුම වගන්ති
III - සියලුම වගන්ති
IV - සියලුම වගන්ති
V - 1,2,3,4 වගන්ති
VI - සියලුම වගන්ති
VII - 1,2,3,4 සහ 6 වන වගන්ති

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :-
  a) ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න හයකින් සමන්විත වේ. ප්‍රශ්න ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා ස්වරූපය වේ.
  b) ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.
  c) සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

(03) ඉංග්‍රීසි(විෂයය අංක 03)

English Grammar

A suitable level of proficiency on the following forms of grammar in spoken and written language is expected from the candidate.

- Tense and Number
- Sentences (Simple/ Compound/Complex/ Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

Writing Skills

The knowledge on the modern formats and styles of writing is tested in this area of study.

- Internal modes of Communication
- Formal Correspondence skills
- Writing Descriptions/ Explanations
- Summary writing skills
- Report Writing Skills
- Minutes of Meeting / Agendas / Invitations
- Comprehension

Reading Skills

Candidate's ability to comprehend a printed text; infer meaning and verbal/ written interpretation is expected.

* Reading and understanding the specific and general meaning of the printed text.
* Reading and Interpretation (Verbal/Written)
* Understanding the cohesion and coherence of a passage.

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :-
  a) ප්‍රශ්න පත්‍රයේ පහත කරුණු සම්බන්ධ ප්‍රශ්න අඩංගු වේ.
     I. ව්‍යාකරණ
     II. අවබෝධය
     III. වාග්මාලාව
     IV. රචනා
  b) සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතුයි.

(04) ව්‍යවහාරික සංඛ්‍යානය (විෂයය අංක 04)

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කර්මාන්ත, කෘෂිකර්ම සංඛ්‍යාති, ජාතික ගිණුම්, තොරතුරු තාක්ෂණ (දත්ත සැකසුම්), නියැදි සමීක්ෂණ, ජන සංගණන හා ප්‍රජා විද්‍යා, මිල දර්ශකාංග හා සිතියම් යන අංශ මඟින් සිදුකරනු ලබන සංඛ්‍යානමය කාර්යයන් පිළිබඳව අදාළ නිලධාරීන්ගේ දැනුම ඇගයීම පිණිස සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි.

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :-
  a) ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න අටකින් සමන්විත වේ. ප්‍රශ්න ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා ස්වරූපය වේ.
  b) ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

11.1 එක් එක් විෂයයෙන් සාමර්ථ්‍ය ලැබීම සඳහා 40% ක් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබා ගතයුතු අතර, කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා සෑම විෂයයකින්ම සාමාර්ථ්‍ය ලැබිය යුතුය. විභාගයට නියමිත විෂයයන් එක් වරකදී හෝ කිහිපවරක දී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

13. මෙම *ගැසට්* නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාද අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයට අනුව අදාළ කරුණු බලපැවැත්වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

10-96

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

සංවර්ධන නිලධාරි සේවයේ I වන, II වන හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024(II)

1.0 සංවර්ධන නිලධාරි සේවයේ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය, සංවර්ධන නිලධාරි සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ සංවර්ධන නිලධාරි සේවයේ III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024(II) (සේවා ව්‍යවස්ථාවේ 10 ඡේදය) රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් **2025 දෙසැම්බර් මස දී** දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මෙම විභාගය අංක 1774/31 සහ 2012.09.07 දිනැති සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව පැවැත්වේ.

3.0 ඉහත සඳහන් සේවයේ එක් එක් ශ්‍රේණිවලට අදාළව පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග පහත සඳහන් පරිදි වේ.

අනු. අංකය	*විභාගයේ නම*	*සංකේත නාමය*
01.	සංවර්ධන නිලධාරි සේවයේ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024(II) (සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා)	**CSDOS - I**
02.	සංවර්ධන නිලධාරි සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024(II) (සංවර්ධන නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරින් සඳහා)	**CSDOS - II**
03.	සංවර්ධන නිලධාරි සේවයේ III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024(II) (සංවර්ධන නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් සඳහා)	**CSDOS - III**

4.0 මෙම විභාගය සම්බන්ධව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

5.0 මෙම විභාගය සඳහා අයදුම් කිරීම අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමයට (online) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවියවන www.slida.lk වෙත පිවිසීමෙන් පමණක් කළ හැක. වෙබ් අඩවියේ මුල් පිටුවේ ඉහළ දිස්වන "Apply for Examinations" දිගුව ඔස්සේ හෝ සෘජුව http://examinationportal.slida.lk/ දිගුව ඔස්සේ පද්ධතිය වෙත පිවිස පරිශීලක ගිණුමක් (User Account) සකස් කර ගත යුතු අතර ඉන්පසු අදාළ විභාග අයදුම්පත සම්පූර්ණ කළ හැක. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය.

විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම **2025.10.10** දින පෙ.ව **8.00** සිට **2025.10.31** දින මධ්‍යම රාත්‍රී **12.00** දක්වා වන කාලය තුළ පමණක් සිදු කළ හැක.

5.1 මෙම විභාගයට අදාළව විභාග මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට අපේක්ෂිත නගර හා ඊට අදාළ නගර අංක පහතින් දැක්වේ.

නගරය	*නගර අංකය*
කොළඹ	01
ගම්පහ	02
කළුතර	03
මහනුවර	04
මාතලේ	05
නුවරඑළිය	06
ගාල්ල	07
මාතර	08
හම්බන්තොට	09
කුරුණෑගල	10
පුත්තලම	11
අනුරාධපුර	12
පොළොන්නරුව	13
කෑගල්ල	14
රත්නපුර	15
බදුල්ල	16
මොනරාගල	17
ත්‍රිකුණාමලය	18
මඩකලපුව	19
අම්පාර	20
වව්නියාව	21
මන්නාරම	22
මුලතිව්	23
කිලිනොච්චිය	24
යාපනය	25

ඉහත සඳහන් යම්කිසි නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවුණහොත් එම මධ්‍යස්ථානය අවලංගු කරන අතර එම අයදුම්කරුවන් යාබද නගරයක පිහිටි මධ්‍යස්ථානයක් වෙත යොමු කෙරෙනු ඇත. ඉල්ලුම් කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

6.0 i. විභාග ගාස්තු.- පළමුවන වරට මෙම විභාගයට අයදුම් කරන නිලධාරින් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරින් විසින් එක් විෂයකට රු. 250/- ක් බැගින් ගෙවිය යුතු වේ.

ii. විභාග ගාස්තු පහත දැක්වෙන ගිණුම වෙත බැර කළ යුතුවේ.

ගිණුමේ නම - ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
ගිණුම් අංකය - 310100119027430
බැංකුව - මහජන බැංකුව - බම්බලපිටිය ශාඛාව

iii. එම ගෙවීමට අදාළව ලබා දෙන මුදල් තැන්පතු පතේ අංකය අයදුම්පතට ඇතුළත් කළ යුතු අතර මුදල් තැන්පතු පතේ ඡායාරූපයක් විභාග අයදුම්පතේ අදාළ ස්ථානයට උඩුගත (Upload) කළ යුතුය.

iv. තවද ගිණුම වෙත මුදල් ගෙවීමේ දී මුදල් ගෙවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, මුදල් තැන්පත් කිරීමට හේතුව යන ස්ථානයේ ඔබට අදාළ විභාගයේ සංකේත නාමය ද ඇතුළත් කර මුදල් තැන්පතු පත සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත (Online) ක්‍රමයට මුදල් ගෙවන නිලධාරින් ද ලැබෙන රිසිට්පතේ ඉහත තොරතුරු සටහන් කළ යුතුය.

(විභාගවල සංකේත නාම 03 ඡේදයේ දක්වා ඇති පරිදි විය යුතුය)

7.0 මාර්ගගත ක්‍රමයට අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී **අයදුම්කරු සතුව සක්‍රීය විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනයක් හා ජංගම දුරකතන අංකයක් පැවතීම අනිවාර්යය වේ** (අයදුම්කිරීමේ දී එක් විද්‍යුත් තැපැල් ලිපිනයක් භාවිතා කළ හැක්කේ එක් පරිශීලක ගිණුමක් සඳහා පමණි.) අයදුම්පත්‍රය මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමු කළ පසු, එය ලැබුණු බව තහවුරු කිරීමේ පණිවිඩයක් විද්‍යුත් තැපැල් ලිපිනයට හා ජංගම දුරකතන අංකයට යොමු කෙරෙනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ විගස ඒ බැව් ඔබ විසින් ලබාදී ඇති ජංගම දුරකථන අංකය වෙත කෙටි පණිවිඩයක් (SMS) මගින් දන්වනු ලැබේ. එවිට ඔබේ පරිශීලක ගිණුම වෙත පිවිස විභාග ප්‍රවේශ පත්‍රය බාගත (Download) කරගත හැක.

අයදුම්පතේ සඳහන් කරනු ලබන අයදුම්කරු සම්බන්ධ කර ගැනීමේ මාර්ගවන ජංගම දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය විභාග කටයුතු අවසන් වනතුරු සක්‍රීයව පවත්වා ගැනීම අයදුම්කරු සතු වගකීමකි. එම ජංගම දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන අපහසුතාවයන් සම්බන්ධ වගකීම් ද අයදුම්කරුවන් සතු බව සැලකිය යුතුය.

8.0 මාර්ගගතව අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් තාක්ෂණික ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් විමසීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ තාක්ෂණික අංශයේ 011-4513368 හා 011-4513366 යන දුරකතන අංක ද, අනෙකුත් සියලු විමසීම් සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අංශයේ 011- 2691062, 011- 2696211 (දිගුව - 156/ 606) යන දුරකතන අංක ද, 2025.10.10 දින සිට 2025.10.31 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා විවෘතව ඇත.

9.0 විභාග ප්‍රවේශපත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. විභාගයට පැමිණීම වෙනුවෙන් ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

11.0 සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරින්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරින්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරින්ට හැකිවේ.

13.0 විභාග ප්‍රතිඵල ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කිරීමෙන් අනතුරුව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළකරනු ලැබේ. එම ප්‍රතිඵල අනුව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිලධාරින්ගේ සේවය ස්ථිර කිරීමේ හා උසස් කිරීම් කටයුතු සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතු වේ.

14.0 විභාග පරිපාටිය : එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටිය හැකි නිලධාරීන් සඳහාවන විෂයයන් සහ විෂය නිර්දේශයන් පහත සඳහන් පරිදි වේ.

1.1 සංවර්ධන නිලධාරි සේවයේ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024(II)

14.1.1 සුදුසුකම්.-මෙම විභාගයට අයදුම් කළ හැක්කේ ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරීන්ට පමණි. සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති නිලධරයන්, සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වී ඇති නිලධරයන් සහ සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වී නොමැති, එහෙත් අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති නිලධරයන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

14.1.2 විෂය නිර්දේශය :

විෂයය	*විෂය අංකය*	*ලකුණු*	*කාලය*	*සමත් වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු*
කාර්යාල ක්‍රම	01	100	පැය 01	40%
ගිණුම් ක්‍රම	02	100	පැය 01	40%
පරිගණක පරීක්ෂණය	03	100	පැය 02	40%

❖ **කාර්යාල ක්‍රම :**

රජයේ කාර්යාලවල භාවිතවන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව ද රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොටගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස්/ නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව ද පරීක්ෂා කෙරේ.

(ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

❖ ගිණුම් ක්‍රම :

රජයේ කාර්යාලවල භාවිතවන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්යය පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ.

(ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.)

❖ පරිගණක පරීක්ෂණය :

(i) තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප
(ii) වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය
(iii) ගොනු කළමනාකරණය

(iv) වදන් සැකසුම :

මූලික කුසලතා, තිරයට හුරුවීම, පාඨ සංරක්ෂණය, පාඨ එකේලි කිරීම, අකුරු වර්ග හා උපලක්ෂණ, අනුච්ඡේද, ඡේද, පේළි අතර පරතරය වෙනස් කිරීම, පිම් අනුයෝගය (Tab Setting) පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය, අක්ෂර හා ව්‍යාකරණ දෝෂ, සමානාර්ථ පද තීරු යෙදීම, පිටුව සැකසීම, ලේඛන මුද්‍රණය, වගු නිර්මාණය, අනුපිළිවෙළට සැකසීම, ගොනු කළමනාකරණය, ලේඛනයක් ලිපින කිහිපයකට යැවීමට සැකසීම, මැක්‍රෝ භාවිතය

(v) පැතුරුම්පත් -

මූලික කුසලතා, ආකෘතිකරණය (Formatting), සංස්කරණය, තීරු හා පරාස, නව ඇතුළත් කිරීම් හා ඉවත් කිරීම්, දත්ත අනුපිළිවෙළට සැකසීම, ප්‍රස්තාර සැකසීම, මුද්‍රණය, @ ශ්‍රිතය (@ Function), මැක්‍රෝ භාවිතය, ගොනු කළමනාකරණය

(vi) දත්ත සමුදාය -

හැඳින්වීමේ මූලික කුසලතා
දත්ත සමුදාය නිර්මාණය හා භාවිතය
ආකෘති
සන්ධානගත ආකෘති, උත්පතන ආකෘති (popup forms)
සංවාද හා පණිවිඩ කොටු
විමසුම්
අනුපිළිවෙළට සැකසීම
වාර්තා ලබා ගැනීම
මැක්‍රෝ භාවිතය

(vii) ඉදිරිපත් කිරීම/ චිත්‍ර සටහන් -

මූලික කුසලතා, සංස්කරණය, ආකෘතිකරණය සැලසුම් යෙදීම

අනුරූප, පසුරු සිත්තම් හා ලුස්තාර නිවේශනය,

කදා මාරුව හා සජීවකරණය, ඉදිරිපත් කිරීමේ මෙවලම් භාවිතය,

මාස්ටර් (Master) කදාව සැකසීම කදා මුද්‍රණය හා සටහන්

(viii) අන්තර්ජාලය -

අන්තර්ජාලය හැඳින්වීම, විශ්ව විසිරි ජාලය,මං සොයන ආකාරය, ව්‍යවහාරික අන්තර්ජාලය

(ix) විද්‍යුත් තැපැල (E- Mail) -

හැඳින්වීම, මූලික කුසලතා, විද්‍යුත් තැපැල ලබා ගැනීම, විද්‍යුත් තැපැල යැවීම, ඊට ප්‍රතිචාර දැක්වීම, ඇමුණුම් භාවිතය, ලිපිනය හඳුනා ගැනීමට කෙටි නාම භාවිතය, පණිවුඩ සම්පාදනය

(බහුවරණ, ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

14.2 සංවර්ධන නිලධාරි සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024(II)

14.2.1 සුදුසුකම් .- ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි. ඒ අතර,

i. ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වී ඇති නිලධාරිහු

සහ

ii. ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වී නොමැති එහෙත් අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ කරන ලද නිලධාරිහු ද මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති.

14.2.2 විෂය නිර්දේශය -

විෂයය	**විෂය අංකය**	**ලකුණු**	**කාලය**	**සමත් වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු**
ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති	04	100 යි	පැය 02	40%
මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	05	100 යි	පැය 02	40%

(ඉහත ප්‍රශ්න පත්‍ර දෙකම I කොටස ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. II කොටස රචනා ප්‍රශ්න 08 කින් සමන්විත වේ. ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සැපයිය යුතුය.)

❖ **ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති**

ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VI, VII, VIII, XII, XIII, XIV, XVII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති

❖ මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය

පරිච්ඡේද I, II, III, IV, V හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය

14.3 සංවර්ධන නිලධාරි සේවයේ III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024(II)

14.3.1 සුදුසුකම්.-ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

14.3.2 විෂය නිර්දේශය

විෂයය	*විෂය අංකය*	*ලකුණු*	*කාලය*	*සමත් වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු*
ව්‍යාපෘති කළමනාකරණය	06	100	පැය 03	40%

❖ **ව්‍යාපෘති කළමනාකරණය**

i. ව්‍යාපෘතියක් යන්න නිර්වචනය කිරීම
ii. ව්‍යාපෘති කළමනාකරණය
iii. ව්‍යාපෘති චක්‍රය
iv. ව්‍යාපෘති පිළියෙළ කිරීම සහ විග්‍රහ කිරීම
v. ව්‍යාපෘති ඇගයීම
 * පිළිගෙවුම් කාලය
 * ශුද්ධ වර්තමාන වටිනාකම
 * අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය
 * පිරිවැය ප්‍රතිලාභ අනුපාතය
 * වාර්ෂික සාමාන්‍ය ඉපැයුම් අනුපාතය
vi. ව්‍යාපෘති සංවිධානය
vii. ඡායා මිල යොදා ගැනීම

15.0 මෙම විභාග නිවේදනයෙන් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

එන්. යූ. නිෂාන් මෙන්ඩිස්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 ඔක්තෝබර් මස 02 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

10-114

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2025)
Second Efficiency Bar Examination for Grade I Statistical Officers in the Department of Census and Statistics - 2016 (2024)

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරින් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් **2026 ජනවාරි මාසයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Service" යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ඔක්තෝබර් මස 13 දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2025 නොවැම්බර් මස 07 දින රාත්‍රී 09.00ට** අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- **සටහන**
  අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයන් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. විභාග ගාස්තු: විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම වාර දෙකකදී හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයයකට හෝ පළමුවරට අයදුම් කරන අපේක්ෂකයන්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන් පසු අයදුම් කරන ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 250/- ක විභාග ගාස්තුවක් අය කෙරේ. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of Bank of Ceylon)

- **සටහන**
  (අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.
  (ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.
  (ඇ) විභාගය සඳහා ගෙවන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

04. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක්

ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පතේ මුද්‍රිත පිටපත දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් " විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

05. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත.
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකිවන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කරගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග කාලසටහනේ පිටපතක් සමඟ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම ද ප්‍රතිඵලදායී වනු ඇත.

06.1 විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වනවිට පැවති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

06.2 විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය.

06.3 විභාගය සඳහා පෙනී සිටින දිනයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති, ප්‍රථම වතාවට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08.

08.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍යය ලෙස, තරග විභාගයක් මඟින් රාජ්‍ය සේවයට බැඳුණු අයෙකු නම්, තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද වශයෙන් තෝරා ගත යුතුය. විභාගයට නියමිත සියලුම විෂයයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

08.2 විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි. විභාගයට ඉදිරිපත් වූ සියලු අයදුම්කරුවන්ගේ ලකුණු ඇතුළත් ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදුකරනු නොලැබේ. විභාගයට නියමිත විෂයන් එක් වරක දී හෝ කිහිපවරක දී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

10. විභාග පටිපාටිය

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

විෂයය	*කාලය*	*ලකුණු*	*සමත් ලකුණු*
1. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය	පැය 2	100	40 %
2. මුදල් රෙගුලාසි	පැය 2	100	40 %

	ප්‍රශ්න පත්‍රය	*විෂයය නිර්දේශය*
1	කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය	➢ මේ සඳහා ආයතන සංග්‍රහයේ XV,XVI,XXIII,XXIV,XXV,XXVII, XXVIII,XXX, XXXIII, XLVII, XLVIII යන පරිච්ඡේද සහ එම පරිච්ඡේද සංශෝධනය කරන ලද චක්‍රලේඛ පිළිබඳව ද අවධානයට ගතයුතු වේ. <u>ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :</u> a) මුළු ප්‍රශ්න ගණන 06 කි. 1 වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10 කින් සමන්විතවන අතර අනෙක් ප්‍රශ්න 05 අනුකොටස් 05කින් සමන්විත වේ. b) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, අනෙක් ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතුය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.
2	මුදල් රෙගුලාසි	මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ: a) VI වන පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදිය භාරකාරිත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම් • 1 කොටස - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරීත්වය හා ආරක්ෂාව • 2 කොටස - උප පත්‍රිකා පොත් • 3 කොටස - මුදල්, මුද්දර යනාදිය පිළිබඳ සමීක්ෂණ මණ්ඩල • 4 කොටස - අග්‍රිම • 5 කොටස - බැංකු ගිණුම් (මු.රෙ. 315 සිට 396 දක්වා සහ ඒවායේ සියලුම සංශෝධන පිළිබඳව ද අවධානයට ගත යුතුය.) b) ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය 2006 - භාණ්ඩ හා වැඩ යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ඒවායේ සියලුම සංශෝධන පිළිබඳව ද අවධානයට ගත යුතුය. {XIII පරිච්ඡේදය - සැපයුම් වැඩ හා සේවා සැපයීම් මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණය, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පටිපාටියේ බැහැර වීම (මු.රෙ.708 සිට 775 දක්වා) } <u>ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය</u> c) මුළු ප්‍රශ්න ගණන 06 කි. 1 ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10 කින් සමන්විතවන අතර අනෙක් ප්‍රශ්න 05 අනුකොටස් 05කින් සමන්විත වේ. d) පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යවන අතර, අනෙක් ප්‍රශ්න 05න් ඕනෑම ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු සැපයිය යුතුය. ඒ අනුව පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි .

සටහන -

- ➢ ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකිය.
- ➢ නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතුවේ.

11. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. මෙම *ගැසට්* නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේය.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාද අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත්වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

10-144

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලවලට ඇතුළත් වීම සඳහා පැවැත්වෙන තරඟ විභාගය - 2025

2025/2027 අධ්‍යයන වර්ෂය සඳහා පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 05/06)

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2025/2027 අධ්‍යයන වර්ෂවලට ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් **2025 දෙසැම්බර් මස මහනුවර දී** පවත්වනු ලබන අතර, ඒ සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමට ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලයේ පූර්ණකාලීන අවුරුදු දෙකක නේවාසික පුහුණුවෙන් පසු මාස 06ක රැකියාස්ථ පුහුණුවක් නම් කරන ලද ආයතන දෙකකින් ලබාගැනීම අනිවාර්ය වේ.

2. ඩිප්ලෝමා පාඨමාලාව :

2.1 මෙම පාඨමාලාව පූර්ණ ලෙස ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලබයි.
2.2 මෙම පුහුණුව හුදෙක් ම වෘත්තීමය සුදුසුකම් ලබාදීමක් පමණක් වේ.
2.3 සෙනුසුරාදා හා ඉරිදා යන දිනවල ප්‍රායෝගික කටයුතු පැවැත්වෙන අතර, ඇතැම්විට දේශන ද පවත්වන බැවින් නේවාසිකාගාරවලින් බැහැරවීමට අවසර දෙනු ලබන්නේ මසකට එක් සති අන්තයක දී පමණි.

3. අයදුම් කිරීම සඳහා තිබිය යුතු සුදුසුකම් :

සියළුම අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී 3.1 හි දැක්වෙන සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය

වන අතරවන අතර, 3.2 හෝ 3.3 හි දැක්වෙන සුදුසුකම් අතරින් එක් සුදුසුකමක් සපුරා තිබීම ප්‍රමාණවත් වේ.

3.1 සියළුම අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සුදුසුකම් පහත පරිදි සපුරාලිය යුතුය.

(අ) සිංහල භාෂාව හා සාහිත්‍යය/දෙමළ භාෂාව හා සාහිත්‍යය, ගණිතය, විද්‍යාව යන විෂයයන්ට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ හා තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද, ඉංග්‍රීසි විෂයය හා තවත් එක් විෂයයකට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම. මෙහි දී සමත් වූ වාර දෙකෙන් එක් වරක දී විෂයයන් 03කට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 05 ක් සමත් වී තිබිය යුතුය.

3.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සුදුසුකම් පහත 3.2.1 හෝ 3.2.2 හි දක්වා සඳහන් කර ඇති පරිදි කුමන ආකාරයකට හෝ සපුරාලිය යුතුය.

3.2.1 අ.පො.ස. (උසස් පෙළ) සමත් අයදුම්කරුවන්,

(අ) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් 03ම එක් වරක දී සමත් වී තිබීම.

(ආ) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂයය ධාරාව තුළ ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් හදාරා විෂයයන් 03ම එක් වරකදී සමත් වී තිබීම.

(ඇ) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී තාක්ෂණවේදය විෂයය ධාරාව යටතේ ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂයයන් හදාරා එකවර විෂයයන් 03ම සමත් වී තිබීම.

3.2.2. අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්,

(අ) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයයන් අතුරෙන් 02ක් එකවර සමත් වී තිබීම.

(ආ) ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයන් අතුරෙන් 02ක් එකවර සමත් වී තිබීම.

(ඇ) තාක්ෂණවේදය විෂයය ධාරාව යටතේ **කෘෂි විද්‍යාව ද සහිතව** විෂයයන් 02ක් එකවර සමත් වී තිබීම.

3.3 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සුදුසුකම් ඉහත දක්වා ඇති කුමන ආකාරයකට හෝ සපුරා නොමැති අයදුම්කරුවන්,

(අ) සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාළව NVQ 4 මට්ටමේ පාඨමාලාවක් හදාරා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.

3.4 මෙහිදී අයදුම්කරුවන් තෝරා ගනු ලබන්නේ ඉහත අ.පො.ස. (උසස් පෙළ) 3.2.1 හි සඳහන් ආකාරයට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාවෙන් 70%ක් හා අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් වෙනුවට (3.3) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාවෙන් 30%ක් වශයෙනි. 3.2.2 සුදුසුකම් සහිත අයදුම්කරුවන් පිළිබඳ සළකා බලනුයේ 3.2.1 සහ 3.3 අවස්ථාවන් මගින් බඳවා ගැනීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාව සම්පූර්ණ නොවුනහොත් පමණි. (මෙම ප්‍රතිශතයන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි වෙනස් විය හැක.)

3.5 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සුදුසුකම් මත 3.2 අවස්ථාවන් යටතේ අයදුම් කරන අපේක්ෂකයන් වයස **2025.11.07** වැනි දිනට අවුරුදු 17ට හා අවුරුදු 25ට වැඩි නොවිය යුතු අතර අවිවාහක විය යුතුය.

3.3 අවස්ථාව යටතේ අයදුම් කිරීමේ දී වයස අවුරුදු 35ට වඩා අඩු විය යුතු අතර විවාහක අවිවාහක බව අදාළ නොවේ.

3.6 මූලික සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් සඳහා ඇතුලත් වීමේ විභාගයට කැඳවනු ලබන අතර ප්‍රතික්ෂේපිත අයදුම්පත් සඳහා දැනුම් දීමක් කරනු නොලැබේ.

4. අයදුම්පත් :

4.1 මෙම දැන්වීමේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පතක් අතින් හෝ පරිගණක භාවිතයෙන් හෝ සකස් කර අත්සන් තබා යොමු කළ යුතුය.

4.2 අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් **2025.11.07** දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන), සත්ත්ව නිෂ්පාදන හා

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය.

4.3 අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ''2025/2027 පශු සම්පත් තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සත්ත්ව පාලන විද්‍යාලයන්ට ඇතුලත්වීම" යන්න සඳහන් කරන්න.

4.4 ජාතික හැඳුනුම්පතෙහි පිටපත, අධ්‍යාපන සහතිකවල පිටපත්/වෘත්තීය නිපුණත්වය සනාථ කරන සහතිකවල පිටපත් හා උප්පැන්න සහතිකයේ පිටපත සත්‍ය බවට තමා විසින් සහතික කර අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

4.5 සෑම අයදුම්කරුවෙකු ම තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රු. 854,880 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

05. විභාග ගාස්තු

5.1 විභාග ගාස්තුව රු. 150.00 කි. අපේක්ෂකයා විසින් එම මුදල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් පේරාදෙණිය, මහජන බැංකුවේ ගිණුම් අංක 057100179027275 වෙත බැර කර රිසිට්පතේ මුල් පිටපත අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය. රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීමට කටයුතු කරන්න. විභාග ගාස්තු ගෙවීමේ දී ස්වයංක්‍රිය මුදල් තැන්පත් යන්ත්‍ර මඟින් හෝ මාර්ගගත ක්‍රමයට මුදල් ගෙවීම නොකළ යුතුය. ගෙවීමට අදාල සියලු විස්තර ඇතුළත් බැංකු මුදල් තැන්පතු පත්‍රිකාවක් මඟින් ගෙවීම් කල යුතුය. මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක.

06. අයදුම්පත් ප්‍රතික්ෂේප වීම

6.1 *ගැසට්* නිවේදනයේ සඳහන් ඉල්ලා ඇති සියළුම සුදුසුකම් නොමැති, නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, අදාළ විභාග ගාස්තු හා ඉල්ලා ඇති සහතිකපත්වල පිටපත් අමුණා නැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.2 අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමේ සියළුම බලතල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතුය.

07. ලිඛිත පරීක්ෂණය හා සම්මුඛ පරීක්ෂණය :

7.1 පුහුණුවන්නන් තෝරාගනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත සුදුසුකම් ලැබූවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුවය.

7.2 ලිඛිත පරීක්ෂණය සඳහා විෂයය නිර්දේශය පහත පරිදි වේ. ලිඛිත පරීක්ෂණය සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පැවැත්වේ.

(I) සත්ත්ව පාලනය - අ. පො. ස. සාමාන්‍ය පෙළ කෘෂිකර්ම විෂය නිර්දේශයේ සත්ත්ව පාලන කොටසට අදාළව සකස්කරන ලද බහුවරණ ප්‍රශ්න - කාලය පැය 01 යි.

(II) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි.

7.3 ලිඛිත පරීක්ෂණය හෝ සම්මුඛ පරීක්ෂණය හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් රජය මඟින් ගෙවනු නොලැබේ.

7.4 ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර සියළුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

08. පාඨමාලාව හැරයාම හා අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම:

8.1 යම් අයදුම්කරුවෙකු විසින් අසත්‍ය තොරතුරු සපයා ඇති බව තෝරාගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඔහුගේ හෝ ඇයගේ ශිෂ්‍යභාවය වහාම අත්හිටුවනු ලැබීමට යටත්වනු ඇත.

8.2 පුහුණු පාඨමාලාව ආරම්භ කල පසු ඉවත්ව යන සිසුන් පුහුණුව සඳහා රජය මගින් ඒ වන විට දරා ඇති සියලු වියදම දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට බැඳී සිටින්නේය. වියදම් ප්‍රමාණය තීරණය කිරීමේ අයිතිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

09. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා නිවේදනය බලාත්මක විය යුතු වන්නේ ය.

ආචාර්ය කේ. ඒ. සී. එච්. ඒ. කොතලාවල,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2025 ඔක්තෝබර් මස 03 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ, පේරාදෙණිය.

ආදර්ශ අයදුම් පත්‍රය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලවලට ඇතුළත් වීම සඳහා පැවැත්වෙන තරග විභාගය

පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2025/2027)

විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යය : (අදාළ කොටුවට කතිරයක් යොදන්න)

සිංහල	දෙමළ

01. (i) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
උදා :

H	E	R	A	T	H		M	U	D	I	Y	A	N	S	E	L	A	G	E
S	A	M	A	N		K	U	M	A	R	A		G	U	N	A	W	A	R
D	H	A	N	A															

(ii) අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා :

G	U	N	A	W	A	R	D	H	A	N	A	H.	M.	S.	K.

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :

02. ලිපිනය : ප්‍රවේශපත්‍ර එවීම සඳහා :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. දිස්ත්‍රික්කය :..................................

05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..

06. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

07. 2025.11.07 වැනි දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

08. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

වට්ස් ඇප් දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

09. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

10. ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් :

(i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය (පළමු වර පෙනී සිටීම) :

වර්ෂය : .... විභාග අංකය : ....

විෂයයන්	*සාමාන්‍ය/සම්මාන/විශිෂ්ඨ*
01.	
02.	
03.	
04.	
05.	
06.	
07.	
08.	
09.	
10.	

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය (දෙවනවර පෙනී සිටීම) :

වර්ෂය : .... විභාග අංකය : ....

විෂයයන්	*සාමාන්‍ය/සම්මාන/විශිෂ්ඨ*
01.	
02.	
03.	
04.	
05.	
06.	
07.	
08.	
09.	
10.	

(ii) අ.පො.ස. (උසස් පෙළ) විභාගය :

විෂයයන්	*සාමාන්‍ය/සම්මාන/ විශිෂ්ට*	*වර්ෂය*	*විභාග අංකය*
01.			
02.			
03.			
04.			

(අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

(iii) සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාළව NVQ 4 මට්ටමේ පාඨමාලාවක් හදාරා තිබීම සනාථ කිරීම.

පාඨමාලාව හදාරන ලද ආයතනයේ නම	පාඨමාලාව හදාරන ලද කාලසීමාව	ලබාගත් සාමාර්ථය
	.... සිට .... දක්වා	

(සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාළව NVQ 4 මට්ටමේ පාඨමාලාවක් හදාරා තිබීම සහතික මගින් සනාථ කළ යුතු ය.)

11. මුදල් ගෙවූ බැංකු රිසිට්පත් අංකය :..
(බැංකු රිසිට්පත ගලවා ගත හැකිවන පරිදි අමුණන්න.)

12. අවසන්වරට අධ්‍යාපනය ලැබූ පාසල්/ආයතනය :...
....
....

13. පාසලෙන්/ආයතනයෙන් අස් වූ දිනය :..

14. සත්ත්ව පාලනය පිළිබඳ දැනට යම් පළපුරුද්දක් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

....
....

15. කෘෂිකාර්මික, සමාජ සේවා, ග්‍රාම සංවර්ධන/ක්‍රීඩා/පළපුරුද්ද :

....
....
....
....
(සහතික පිටපත් ඇමිණිය යුතුය.)

16. අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනකුගේ නම් සහ ලිපිනයන් :

1. ....
....

2. ....
....

ඉහත දැක්වෙන විස්තර මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය වූ ද, නිවැරදි වූ ද තොරතුරු බව මාගේ සුපුරුදු අත්සන තබා මෙයින් සහතික කරන අතර, යම් ලෙසකින් මා මෙම පුහුණුවට තෝරා ගත් පසු අසත්‍ය තොරතුරක් පිළිබඳ හෙළිදරව් වුවහොත්, මගේ ශිෂ්‍යභාවය අත්හිටුවීමට හැකි බව ද, පුහුණුව ලබන කාලයේ දී මා වෙනුවෙන් රජය දරා ඇති යම් මුදලක් ගෙවීමට සිදු වේ නම්, එම මුදල ගෙවීමට ද මම බැඳී සිටින බව ද දන්වමි.

....,
අයදුම්කරුගේ අත්සන.

දිනය :..............................

***සටහන* :** මෙම අයදුම්පත සමග අමුණා ඉදිරිපත් කරන සහතික පිටපත් ලේඛන :

1. ....
2. ....
3. ....
4. ....

අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .... මහතා/මහත්මිය/මෙනවිය මා ඉතා හොඳින් දන්නා හඳුනන අයෙකි. ඔහු/ඇය විසින් නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය ඉහත අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

....,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :..............................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :..
තනතුර :..
ලිපිනය :..

(කරුණාකර නිල මුද්‍රාව තබන්න).

10-117

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.